# පුරප්පාඩු

## ශ්‍රී පාලි මණ්ඩපය - කොළඹ විශ්වවිද්‍යාලය

**ශ්‍රී පාලි මණ්ඩපයෙහි පුරප්පාඩුව පවතින හෙද නිළධාරී II ශ්‍රේණිය තනතුර සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් 2023 අප්‍රේල් 28 වැනි දින දක්වා අයදුම්පත් භාර ගනු ලැබේ.**

**01. හෙද නිළධාරී II ශ්‍රේණිය - පුරප්පාඩු 01**

සුදුසුකම්:

1. දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් තුනකට සම්මාන සහිතව විෂයන් හයකින් (06) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

   සහ

2. ශ්‍රී ලංකා වෛද්‍ය මණ්ඩලයේ හෙද සහතිකය ලබා තිබිය යුතුය.

වැටුප් පරිමාණය : රු: 31,625.00 + 7,800.00 (මාසික) = රු: 39,425.00

බඳවා ගන්නා ක්‍රමය : සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**<u>කොන්දේසි හා ප්‍රතිලාභ</u>**

1. තෝරා ගනු ලබන අයදුම්කරු කොන්ත්‍රාත් පදනම මත වසරක කාලයකට බඳවා ගනු ලැබේ. සේවා කාලය සතුටුදායක නම් සේවා දිගුවක් සඳහා සලකා බලනු ලැබේ. මෙම පත්වීම සම්බන්ධයෙන් අපේක්ෂකයන් ස්ථිර පත්වීම් සඳහා සුදුසුකම් නොලබයි.
2. අපේක්ෂකයන් කෙටි ලැයිස්තු ගත කිරීම හා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම විශ්වවිද්‍යාලයේ අභිමතය පරිදි සිදුවේ.
3. තෝරා පත් කර ගනු ලබන අයදුම්කරුවන් තම ඉපයීම් වලින් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු අතර විශ්වවිද්‍යාලය මගින් එකී ඉපයීම් වලින් 15% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලටද බැර කරනු ලැබේ.
4. තවද 3% ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් සේවක භාරකාර අරමුදලට බැරකරනු ලැබේ,
5. බඳවා ගැනීමට අදාළ අනෙකුත් කොන්දේසි 16/1978 දරණ විශ්වවිද්‍යාල පනත හා එහි අනෙකුත් සංශෝධන, නියමාවලි නීති හා රෙගුලාසිවලට අනුකූල වේ,

**අයදුම්පත් එවිය යුතු ආකාරය**

1. ඉහත තනතුරු සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන අයදුම්කරුවන්ට ශ්‍රී පාලි මණ්ඩපයේ වෙබ් අඩවියෙන් (https://spc.cmb.ac.lk) ආදර්ශ අයදුම්පතක් බාගත (download) කළ හැකිය.

2. සම්පූර්ණ කරන ලද අයදුම්පත, සත්‍ය පිටපත් බවට සහාත කරන ලද අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්වලට අදාළ සහතික පිටපත් සමග නියෝජ්‍ය ලේඛකාධිකාරී, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය, වැවල, හොරණ යන ලිපිනයට **2023 අප්‍රේල් 28** දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

3. අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුර පැහැදිළිව සඳහන් කළ යුතුය.

4. අසම්පූර්ණ, අපැහැදිලි, අදාළ සහාත කිරීම් සිදු නොකළ, සහතික වල පිටපත් අමුණා නොමැති හෝ ප්‍රමාද වී එවනු ලබන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර එවැනි අයදුම්පත් කිසිදු හේතුවක් මත යළි සලකා බලනු නොලැබේ.

නියෝජ්‍ය ලේඛකාධිකාරී, ශ්‍රී පාලි මණ්ඩපය, වැවල, හොරණ
ලේඛකාධිකාරී, කොළඹ විශ්වවිද්‍යාලය වෙනුවට
2023.04.20